# සමාන අවස්ථා පිළිබඳ කොමිෂන් සභාවේ පුද්ගලික තොරතුරු එක්රැස් කිරීමේ ප්‍රකාශය සහ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශය ("ප්‍රකාශය")

පුද්ගලික දත්ත (පෞද්ගලිකත්ව) ආඥාපනතෙහි ("PD(P)O") (486 වන පරිච්ඡේදය, හොංකොං නීති) නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපි ප්‍රතිඥා දෙමු. එසේ කටයුතු කිරීමේදී, ආරක්ෂාව සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රමිතීන් සමග අපගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් පුද්ගලික දත්ත (පෞද්ගලිකත්ව) ආඥාපනතට අනුකූලව ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා සාධාරණ මට්ටමින් ප්‍රායෝගික පියවර ගන්නෙමු.

## තොරතුරු රැස් කිරීම සහ භාවිතය

ඔබ සමාන අවස්ථා පිළිබඳ කොමිෂන් සභාව (EOC) වෙතින් විමසීම් හෝ පැමිණිලි කරන විට, එම සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කරන විට, අප විසින් සංවිධානය කරනු ලබන අවස්ථාවන්ට සහභාගී වන විට හෝ අප සමඟ සන්නිවේදනය කරන විට ඔබට අදාළ පුද්ගලික තොරතුරු ("පුද්ගලික දත්ත") අප විසින් රැස්කර ගනු ලැබිය හැකිය. අවශ්‍ය පුද්ගලික දත්ත සපයා නොමැති නම්, ඔබගේ විමසීම් හා පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ ඔබ වෙත සේවා සැපයීමට හෝ සේවා සැපයීම අඛණ්ඩව සිදු කිරීමට අපට නොහැකි විය හැක.

පහත සඳහන් ඕනෑම අරමුණක් වෙනුවෙන් අප විසින් ඔබේ පුද්ගලික දත්ත වරින් වර භාවිත කරනු ලැබිය හැකිය:

a. ඔබගේ විමසීම් සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පසු විපරම් කිරීම;

b. අපගේ ඕනෑම ව්‍යවස්ථාපිත කාර්යයක් ඉටු කිරීම;

c. අපගේ සේවා භාවිතා කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ සේවාවන් වැඩිදියුණු කිරීම සහ අධීක්ෂණය කිරීම;

d. සේවා වැඩිදියුණු කිරීම් සඳහා පර්යේෂණ පැවැත්වීම;

e. හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සමාන අවස්ථා පිළිබඳ කොමිෂන් සභා රක්ෂණකරුට දැනුම් දීම හෝ ඔබ පාර්ශ්වයක් ලෙස සම්බන්ධ වී ඇති හිමිකම් පෑමක් වෙනුවෙන් පෙනී සිටීම;

f. අපගේ අනෙකුත් සේවාවන් පිළිබඳ තොරතුරු සහ තොරතුරු අඩංගු ලිපි ලේඛන ඔබ වෙත එවීම (ඔබගේ එකඟත්වයට යටත්ව);

g. නියාමන හෝ වෙනත් අධිකාරීන් විසින් නිකුත් කරන ලද ඕනෑම නීති, රෙගුලාසි හෝ මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කිරීම;

h. ඔබ විසින් එකඟ වී ඇති වෙනත් අරමුණු; හා

i. ඉහත සඳහන් ඕනෑම කාරණයකට අදාළ අරමුණු.

## කුකීස් භාවිතය

ඔබ අපගේ වෙබ් අඩවියට පිවිසෙන විට, අප විසින් ඔබගේ පිවිසීම "hit" (වෙබ් සර්වරයක සටහනක් වෙත පිවිසුම ඉල්ලන පිටු ඉල්ලීම් විධානයක්) ලෙස පමණක් වාර්තා කරගනු ලබන අතර ඔබට අදාළ පෞද්ගලිකවය හඳුනාගත හැකි පුද්ගලික තොරතුරු කිසිවක් එක්රැස් නොකරමු. අනෙක් අතට, ඔබ "කුකීස්" සක්‍රීය කර ඇත්නම්, ඒවා ඔබගේ පරිගණකයේ වෙබ් බ්‍රව්සරයේ ගබඩා වෙනු ඇත. "කුකී" එකක් යනු ඔබ වෙබ් අඩවියක් පිරික්සමින් සිටියදී වෙබ් අඩවියකින් එවන ලද තොරතුරු විශේෂයකි. එමගින් ඔබගේ වරණයන් වාර්තා කර ඔබගේ වෙබ් බ්‍රවුසරයේ ගබඩා කෙරෙනු ලැබේ. ඔබගේ පුද්ගලික දත්ත එක්රැස් කිරීම සඳහා අපි කුකීස් භාවිතා නොකරමු. ඔබට ඔබගේ වෙබ් බ්‍රවුසරයේ කුකීස් අක්‍රිය කළ හැකි නමුත් ඔබ කුකීස් අක්‍රිය කළහොත්, ඔබ කැමති භාෂාව තේරීම වැනි අපගේ වෙබ් අඩවියේ ඇති සමහර විශේෂාංග භාවිත කිරීමට නොහැකි වනු ඇත.

## දත්ත ආරක්ෂණය සහ අනාවරණය

අපි සියලු පුද්ගලික දත්තවල රහස්‍යභාවය සුරකින නමුත් ඉහත දක්වා ඇති අරමුණු සඳහා පහත සඳහන් පුද්ගල කාණ්ඩ වෙත (හොංකොං ඇතුළත හෝ ඉන් පිටත) පුද්ගලික දත්ත අනාවරණය කිරීම හෝ යැවීම සිදු කළ හැකිය:

a. සමාන අවස්ථා පිළිබඳ කොමිෂන් සභාව විසින් සපයනු ලබන සේවාවන් සඳහා ඔබගේ පැමිණිල්ල(පැමිණිලි), විමසීම(විමසීම්), අයදුම්පත(අයදුම්පත්) සහ ඉල්ලීම (ඉල්ලීම්) සම්බන්ධයෙන් අදාළ කවර හෝ පාර්ශ්වයන්;

b. නීති උපදේශකයින් සහ පර්යේෂණ උපදේශකයින් හා  නියෝජිතයන් වැනි, සේවා සැපයීම සඳහා අප විසින් පත් කර සිටින අනෙකුත් වෘත්තීය උපදේශකයින්;

c. නියාමන හෝ වෙනත් අධිකාරීන් හෝ නීති ක්‍රියාත්මක කරන ආයතනයක් හෝ ඕනෑම අධිකරණයක් හෝ අධිකරණ ආයතනයක් විසින් නිකුත් කරන ලද කවර හෝ නීති, රෙගුලාසි හෝ මාර්ගෝපදේශ මගින් පුද්ගලික දත්ත අනාවරණය කිරීමට අප බැඳී සිටින හෝ අප වෙත නියම කර සිටින සිටින පුද්ගලයින්; සහ/හෝ

d. කිසියම් නීති විරෝධී ක්‍රියාකාරකම් හෝ සැක කටයුතු ක්‍රියාකාරකම් වැළැක්වීම හෝ හඳුනා ගැනීම සඳහා අප විසින් ක්‍රියාත්මක කරන ලද කවර හෝ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග යටතේ අප විසින් පුද්ගලික දත්ත අනාවරණය කළ යුතු පුද්ගලයින්.

## වෙනත් වෙබ් අඩවි වෙත සබැඳි

ඔබගේ පහසුව සඳහා අපි වෙනත් වෙබ් අඩවි වලට අධිසබැඳි ලබා දෙන්නෙමු. මෙම ප්‍රකාශය අපගේ වෙබ් අඩවියට පමණක් අදාළ වන අතර අනෙකුත් වෙබ් අඩවිවලට අදාළ නොවන බව කරුණාවෙන් සලකන්න.

ඔබ වෙනත් කිසියම් වෙබ් අඩවියකට සම්බන්ධ කරන කිසියම් අධිසබැඳියක් ක්ලික් කළහොත්, දත්තවල පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සහ අනෙක් වෙබ් අඩවියේ කුකීස් වලට ඔබ නිරාවරණය වීම සමබ්න්ධයෙන් අප විසින් වග කියනු නොලැබේ. අදාළ වෙබ් අඩවියේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය සහ භාවිතයන් කියවා බලන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ.

## පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය සහ පුද්ගලික දත්ත නිවැරදි කිරීම

පුද්ගලික දත්ත (පෞද්ගලිකත්ව) ආඥාපනත යටතේ, සාමාන්‍යයෙන්, පුද්ගලයෙකුට සිය පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය ඉල්ලා සිටීමට සහ ඔහුගේ/ඇයගේ කවර හෝ වැරදි පුද්ගලික දත්ත නිවැරදි කරන ලෙස අපට නියම කර සිටීමට අයිතියක් ඇත. පුද්ගලික දත්ත වෙත ප්‍රවේශ වීම සහ දත්ත නිවැරදි කිරීම සඳහා වන ඕනෑම ඉල්ලීමක් සමාන අවස්ථා පිළිබඳ කොමිෂන් සභාව, 16/F, 41 හියුං යිප් පාර, වොන්ග් චුක් හැං, හොංකොං (Equal Opportunities Commission, 16/F, 41 Heung Yip Road, Wong Chuk Hang, Hong Kong) යන ලිපිනයට පහත සඳහන් ඕනෑම අයෙකු වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය:

a. අධ්‍යක්ෂ (පැමිණිලි සේවා) හෝ ප්‍රධාන නීති උපදේශක - යන අය අතරින් එක් අයෙකු සතුව ඔවුන්ගේ අදාළ සේවා ක්ෂේත්‍ර තුළ තිබෙන පුද්ගලික දත්ත සම්බන්ධයෙන්;

b. අධ්‍යක්ෂ, ආයතනික සැලසුම් සහ සේවා - අනෙකුත් සියලුම වාර්තාවල තිබෙන පුද්ගලික දත්ත සම්බන්ධයෙන්.

විස්තර සඳහා, කරුණාකර අපගේ 'පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සහ පරිචයන්' වෙත පිවිසෙන්න.

දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා කෙරෙන ඕනෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම වෙනුවෙන් ගාස්තුවක් අය කිරීමේ අයිතිය අප සතු වේ.

මෙම ප්‍රකාශය ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති අතර චීන භාෂාවට සහ EM භාෂා නවයකට පරිවර්තනය කර ඇත. ඉංග්‍රීසි සහ අනෙකුත් අනුවාද අතර යම් අනනුකූලතාවක් හෝ සට්ටනයක් තිබේ නම්, ඉංග්‍රීසි අනුවාදය බලපැවැත්වෙනු ඇත.

2021 ඔක්තෝම්බර් මාසයේදී සංශෝධනය කරන ලදී